**පීපල්ස් ට්‍රැවල්ස් ප්‍රයිවට් ලිමිටඩ් - 2021/2022**
**---------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

පීපල්ස් ට්‍රැවල්ස් ප්‍රයිවට් ලිමිටඩ් ("සමාගම") හි 2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහාය මා ලබා ගන්නා ලදි.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම, අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

**1.4 විගණන විෂය පථය**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැළසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වැරදි නියෝජනය හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැළසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමාගමේ අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැළසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩල විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව,සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව සමාගම කටයුතු කර ඇති බව,

- සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 1.5 ලැබිය යුතු ගිණුම් සහ ගෙවිය යුතු මුදල්

### 1.5.1 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) සමස්ත වෙළෙඳ ණය ගැතියන්ගෙන් රු. 10,046,001 ක් හෝ සියයට 57 ක් රාජ්‍ය ආයතනවලින් ලැබිය යුතු ලෙස නියෝජනය කරන අතර රු.3,611,080 ක් හෝ මුළු ලැබිය යුතු මුදල්වලින් සියයට 20 ක් මහජන බැංකුවෙන් ලැබිය යුතු වේ. සමාගම සතුව දින 15 ක ණය ප්‍රතිපත්ති කාලසීමාවක් පැවතියද රු. 17,646,938 (වෙළඳ ණය) තුල වසර 01 කට වැඩි කාලයක් සඳහා නොපියවූ ශේෂයන් ලෙස රු.8,686,500 ක් ඇතුළත් වන අතර නියමිත කාල සීමාව තුළ සමාගමට හිඟ ශේෂය ලබා ගැනීමට නොහැකි විය.<br><br>(ii) රු.2,868,261 ක් වූ කාර්ය මණ්ඩල ණයගැති ශේෂය තනි පුද්ගල පාරිභෝගිකයන් මෙහෙයවන පුද්ගලයාගේ නම යටතේ ලැබිය යුතු ශේෂයන් ලෙස නිරූපණය කරයි.<br><br>(iii) 2022 මාර්තු 31 දිනට මුළු කාර්ය මණ්ඩල ණය ගැතියන්ගෙන් රු. 384,083 ක් හෝ සියයට 13 ක් දින 360 ට වැඩි වන අතර නියමිත කාල සීමාව තුළ එම ලැබිය යුතු ශේෂයන් එකතු කර ගැනීමට සමාගමට නොහැකි විය. | සටහන් කර ගන්නා ලදී. හඳුනා ගන්නා ලද ණය ගැති ශේෂ දැනටමත් අයකරගෙන ඇති අතර දැනට පවතින වසංගත තත්ත්වය හේතුවෙන් සමහර ආයතනික ණය ගැතියන් තවමත් ලැබිය යුතුය. තත්වය යථා තත්ත්වයට පත් වූ පසු ඒවා නිරවුල් කර ගන්නා අතර ගෙවීම් සඳහා ලිඛිත මතක් කිරීම් සඳහා පිළිතුරු ලැබෙන්නේ අඩුවෙනි. එබැවින්, අපි අදාළ බලධාරීන් හමුවී ගෙවීම් පිළිබඳ පසු විපරම් කරන්නෙමු. | කිසිදු ප්‍රමාදයකින් තොරව ශේෂයන් ආපසු අයකර ගැනීමේ හැකියාව සහතික කිරීම සඳහා පසු විපරම් ක්‍රියා පටිපාටි ශක්තිමත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. |

### 1.5.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පීපල්ස් ට්‍රැවල්ස් ප්‍රයිවට් ලිමිටඩ් හි ආපසු ගෙවිය යුතු මුදල්<br><br>සමාගම් ප්‍රතිපත්තියට අනුව, ආපසු ගෙවිය යුතු ආදායම් වසර 2ක කාල සීමාවක් තුළ එකතු නොකළේ නම් සහ පාරිභෝගිකයා විසින් ඊමේල් මාර්ගයෙන් මුදල් ආපසු ලබා ගැනීමට පුද්ගලයෙකු නම් කර නොමැති නම් හෝ පාරිභෝගික පාර්ශ්වයෙන් නම් කරන ලද පුද්ගලයා සම්බන්ධ කර ගත නොහැකි නම්, එය ලාභයක් ලෙස සලකා ලාභය හා අලාභය වෙත මාරු කිරීම කළ යුතුය. කෙසේ වෙතත්, වසර 2 ක කාලයකට පෙර වූ ගනුදෙනු හේතුවෙන් නිශ්කාෂනය වීමකින් තොරොව රු. 915,561 ක් පීපල්ස් ට්‍රැවල්ස් ප්‍රයිවට් ලිමිටඩ් හි ආපසු ගෙවිය යුතු මුදල් ලෙස රැඳී තිබුණි. | සටහන් කර ගන්නා ලද අතර සඳහන් කර ඇති ආපසු ගෙවීම් ලාභයට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | සමාගම් ප්‍රතිපත්තියට අනුකූල වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. |

## 1.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොඩනැගිල්ල සඳහා නිසි බදු ගිවිසුමක් 2020 වසරේ සිට මහජන බැංකුව සහ පීපල්ස් ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගම අතර නොතිබුණි. | සටහන් කර ගන්නා ලද අතර මහජන බැංකුව සමඟ ඇති බදු ගිවිසුම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | එම ලේඛන ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. |

## 1.7 බදු රෙගුලාසි වලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු. 453,695 ක වැට් බදු ශේෂයක් 2019/20 මුදල් වර්ෂයේ සිට ඉතිරිව තිබුණි. | සටහන් කර ගන්නා ලදී.මෙය සැලකිල්ලට ගෙන දැඩිව අනුගත වේ. | අනාගත දණ්ඩන ප්‍රතිපාදන වළක්වා ගැනීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ අවශ්‍ය විධිවිධාන සලසා ගන්න. |

# 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 6,500,086 ක අලාභයක් වූ අතර ඉකුත් වර්ෂයේ අනුරූප අලාභය රු. 23,212,868 කි. එබැවින්, පෙර වසරට සාපේක්ෂව මූල්‍ය අලාභය රු. 16,712,782 ක අඩුවීමක් නිරීක්ෂණය විය.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය

සමාගමේ මෙම වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල පසුගිය වර්ෂය සමඟ සාරාංශගතව පහත වගුවේ දැක්වේ.

| විස්තරය | 2022<br>රු. | 2021<br>රු. | විචලන ප්‍රමාණය වැඩිවීම/ (අඩුවීම)<br>රු. | විචලනය % | විචලනය සඳහා හේතුව |
|---|---|---|---|---|---|
| <u>ආදායම</u> | | | | | |
| දඹදිව/ ඉන්දියානු සංචාර වලින් ලැබෙන ආදායම | - | 26,098 | (26,098) | (100) | Covid බලපෑම, අයහපත් ආර්ථික තත්ත්වය සහ විදේශ සංචාර කටයුතු සඳහා ඩොලර් නොමැතිකම. |
| ශුද්ධ ආදායම - ගුවන් ටිකට්පත් සඳහා කොමිස් | 12,727,533 | 1,151,808 | 11,575,725 | 1,005 | විදේශ සංචාර සඳහා ගනුදෙනුකරුවන්ගේ ඉල්ලීම් මත සැලකිය යුතු ප්‍රවේශපත්‍ර ප්‍රමාණයක් වෙන්කරවා ගැනීම. |
| වීසා මත ශුද්ධ කොමිස් | 529,166 | 12,409 | 516,757 | 4,164 | වීසා සේවා වැඩි කිරීම. |

**<u>වියදම්</u>**

| | | | | | |
|---|---|---|---|---|---|
| බෙදාහැරීමේ වියදම් | 171,726 | 139,284 | 32,442 | 23 | පෙර වසරට වඩා නිතර නිතර පුවත්පත් දැන්වීම් පළ කිරීම. |
| පරිපාලන වියදම් | 22,754,370 | 24,949,30 | (2,194,936) | (9) | 2022 ජනවාරි දක්වා වැටුප් කපා හැරීම, සේවකයින් කිහිප දෙනෙකු ඉල්ලා අස්වීම, බඳවා ගැනීම් අත්හිටුවීම සහ දුරකථන වියදම් අඩු කිරීම. |
| මූල්‍ය පිරිවැය | 688,748 | 1,147,361 | (458,613) | (40) | ලීසිං ගොඩනැගිලි සඳහා පොලිය අඩු වීම. |

**2.3** අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතමයන් පෙර වසරට සාපේක්ෂව වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතයක් සමඟින් පහත දක්වා ඇත.

| ප්‍රධාන අනුපාත | **2022** | **2021** |
|---|---|---|
| මෙහෙයුම් ලාභ ආන්තිකය | (41.7%) | (1451.21%) |
| ශුද්ධ ලාභ ආන්තිකය | (46.6%) | (1862.30%) |
| හිමිකම් මත ප්‍රතිලාභය | (10.58%) | (36.76%) |
| වත්කම් මත ප්‍රතිලාභය | (6.77%) | (28.17%) |
| ජංගම අනුපාතය | 1.5 | 3.20 |
| ණය අනුපාතය | 0.36 | 0.23 |
| ණය හිමිකමට අනුපාතය | 0.56 | 0.30 |